කෘෂිකර්ම, පශුසම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
கமத்தொழில், கால்நடை, காணி, நீர்ப்பாசன அமைச்சு
**Ministry of Agriculture, Livestock, Lands & Irrigation**
"ගොවිජන මන්දිරය", 80/5, රජමල්වත්ත පාර, බත්තරමුල්ල. "கொவிஜன மந்திரய", 80/5, இராஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Govijana Mandiraya", 80/5, Rajamalwatte Road, Battaramulla.

මගේ අංකය / எனது இல. / My No. } එල්ඩී/4/6(අමා.ච.ලේ.)    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2005.04.

චක්‍රලේඛ අංකය :- 2005/ඉඩම්/1

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

*ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් වාර්ෂික බලපත්‍ර මත රජයේ ඉඩම් බැහැර කිරීම.*

රජයේ ඉඩම් ආඥා පනත හෝ ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ අනාගතයේදී දීර්ඝකාලීන බලපත්‍රයක් හෝ ඉඩම් සංවර්ධන ආඥා බලපත්‍රයක් ලබාගැනීමේ ඉඩකඩ සලසමින් ඇතැම් ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් රජයේ ඉඩම් වාර්ෂික බලපත්‍ර මත බැහැර කිරීම් සිදුවන බවට ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් අතිගරු ජනාධිපතිතුමියට වාර්තා කර ඇති බැවින්, මෙම තත්ත්වය වහාම නැවැත්වීම සඳහා එතුමිය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලදුව රජයේ ඉඩම් බැහැර කිරීමේදී පහත සඳහන් පරිදි ක්‍රියාකිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

1. 1992 අංක 58 දරණ බලතල පැවරුම් (ප්‍රාදේශීය ලේකම්වරුන්) පනත යටතේ රජයේ ඉඩම් පරිපාලනයට අදාළ නීති යටතේ දිසාපතිවරුන් වෙත පැවරී තිබූ බලතල ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත පැවරී ඇත. එසේ වුවද රජයේ ඉඩම් සින්නක්කර කිරීම, ඉඩම් කච්චේරි පැවැත්වීම වැනි ඉඩම් වෙන්කිරීම් හා බැහැර කිරීම් වලදී දිසාපතිවරුන් ක්‍රියාකළ පරිදිම එවැනි කරුණු සඳහා දිස්ත්‍රික් කෘෂිකාර්මික කමිටුවේ එකඟත්වය හා ඉඩම් කොමසාරිස්වරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

2. ඉඩම් සංවර්ධන ආඥා පනත හා ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යටතේ බැහැර කරන ලද ඉඩම් බලපත්‍ර අවලංගු කිරීම, උරුමයන් වෙනස් කිරීම හා පසු උරුමකරුවන් නම් කිරීම වැනි කාර්යයන් ප්‍රාදේශීය ලේකම්වරුන්ට පැවරී ඇති බලතල යටතේ ක්‍රියාත්මක කළ හැක. එසේ වුවද ඉඩම් සංවර්ධන ආඥා පනත, ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත් වල විධිවිධානයන්, රෙගුලාසි මෙන්ම ඒ සම්බන්ධව ඉඩම් කොමසාරිස්වරයා විසින් වරින් වර නිකුත් කර ඇති චක්‍රලේඛ වල සඳහන් නියෝග වලට අනුකූලව එකී කාර්යයන් ඉටුකිරීමට ප්‍රාදේශීය ලේකම්වරු බැඳී සිටිති.

3. පසුකාලීනව ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍රයක් හෝ රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීර්ඝකාලීන බදුකරයක් නිකුත් කිරීමේ අදහසින් කිසිම අවස්ථාවක ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් වාර්ෂික බලපත්‍ර නිකුත් නොකළ යුතුය. හුදෙක් තාවකාලික කාර්යයක් සඳහා වුවද වාර්ෂික බලපත්‍රයක් නිකුත් කිරීම අවශ්‍යවන්නේ නම් ඒ සඳහා ඉඩම් කොමසාරිස්වරයාගේ/පළාත් ඉඩම් කොමසාරිස්වරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

ඉඩම් අන්සතු කිරීමේ වැඩ සටහන්, ඉඩම් සංවර්ධන ආඥා පනත, ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත් වල විධිවිධානයන්, රෙගුලාසි මෙන්ම ඊට අදාළව ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා විසින් වරින්වර නිකුත් කර ඇති චක්‍රලේඛ වල සඳහන් නියෝග වලට පටහැනිව ප්‍රාදේශීය ලේකම් වරුන් විසින් කරනු ලබන කටයුතු ශූන්‍ය හා බලරහිත වුවද, එමගින් ඉඩම් පරිපාලනය අවුල්වන අතර, මහජනතාව වුවද අපහසුතාවයට, අසාධාරණයට ලක්වන බැවින් පළමුව සඳහන් කළ අමාත්‍ය මණ්ඩල තීරණය මත සහ පළාත් ඉඩම් අමාත්‍යවරුන්ගේ අනුදැනුම ද සහිතව මෙම චක්‍ර ලේඛය නිකුත් කරනු ලැබේ.

මෙය ක්‍රියාත්මක කිරීම පිළිබඳව ඔබගේ විශේෂ අවධානය යොමු කරවමි. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ එකගතාවය මතය.

ලේකම්,
කෘෂිකර්ම, පශුසම්පත්, ඉඩම් හා
වාරිමාර්ග අමාත්‍යාංශය.

පිටපත්:-

01. අග්‍රාමාත්‍ය ලේකම්.
02. ලේකම්, මහවැලි, ගංගානිම්න හා රජරට සංවර්ධන අමාත්‍යාංශය.
03. ඉඩම් කොමසාරිස් ජනරාල්.
04. දිස්ත්‍රික් ලේකම්.
05. සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන්.
06. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.

} දැන ගැනීම සඳහා.

ආ/30